# නාග රූපයේ සංකේතාර්ථ පිළිබඳ විමසීමක්

ජී. ඩී. ඩබ්. ලක්මාලි[1]

සිංහල සංස්කෘතියෙහි ප්‍රකට ව පවතින සංකල්පයක් ලෙස නාග සංකල්පය හැඳින්විය හැකි ය. සාහිත්‍ය කලා හා ආගම් දර්ශන ආදියෙහි මේ සංකල්පය භාවිත කිරීම සම්බන්ධයෙන් විවිධ අර්ථකථන ඉදිරිපත් ව පවතී. ඒ අතර ප්‍රකට ව පවතින කරුණක් නම් නාගයා රාගයේ සංකේතයකි යන්න යි. එහෙත් පෙරදිග සාහිත්‍යයෙහි මේ සම්බන්ධයෙන් ප්‍රකාශිත තොරතුරු විමසා බැලීමේ දී නාග රූපය රාගයේ සංකේතයක් වශයෙන් නිරූපණය කිරීම කෙතෙක් දුරට නිවැරදි ද යන ගැටලුව මතු වේ. ඇතැම් විද්වතුන් ප්‍රකාශ කරනුයේ නාගයා හා රාගය අතර සමානත්වයක් නොමැති බව යි. ඓතිහාසික හා සාහිත්‍යික මූලාශ්‍රය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයන මඟින් සිදු කරන ලද මේ පර්යේෂණයෙහි අරමුණ වූයේ විවිධ සංකේතාර්ථ ජනනය සඳහා සාහිත්‍ය, කලා ශිල්ප හා ජනශ්‍රැති විෂය ක්ෂේත්‍රයන්හි භාවිත නාග සංකල්පය රාගය සංකේතවත් කිරීම සඳහා භාවිත කිරීමේ සැබෑ පරමාර්ථය ගවේෂණය කිරීම යි. එහි දී අනාවරණය වූ පරිදි නාගයා රාගයේ සංකේතයක් නො ව රාගය වැළැක්වීමේ සංකේතයක් බවත් නාගයා ගේහසිත ප්‍රේමය පිළිබඳ සංකේතයක් වුව ද ලිංගික ආශාව හා රාගය පමණක් සංකේතවත් නො කිරීමත්, පූජනීය ස්ථාන කෙලෙසුන්ගෙන් කිලිටි වීම වළක්වාලන සංකේතයක් වශයෙන් යොදාගත් බවත් හඳුනාගත හැකි විය. ඒ අනුව නාග සංකල්පය රාගයට ප්‍රතිවිරුද්ධ අදහසක් සංකේතවත් කිරීම සඳහා භාවිත කර ඇති බව තහවුරු වේ.

**ප්‍රමුඛ පදඃ** නාග සංකල්පය, සංස්කෘතිය, රාගය, ගේහසිත ප්‍රේමය, සංකේතාර්ථ

---

[1] සිංහල අධ්‍යයනාංශය